## 2.1 ස්වාභාවික වරණය, අභාවයාගේ අභාවය පිළිබඳ නියමය සහ අවුරුදු ක්‍රීඩා

ජේ. කලන්සූරිය, එන්, රාමනායක, ඒ. රත්නායක
ක්‍රීඩා විද්‍යා හා ශාරීරික අධ්‍යාපන අධ්‍යයන අංශය
කැලණිය විශ්වවිද්‍යාලය

---

## ABSTRACT

සිංහල අවුරුදු ක්‍රීඩාවන්හි සාරධර්ම ගිලිහී ගොස් විශාල ලෙස වෙනස් වී ඇති බව මැසිවිලි ස්වභාවයෙන් ප්‍රකාශ කිරීම දක්නට ඇත. මීට අඩසිය වසකට පෙර පැවති ඇතැම් අවුරුදු ක්‍රීඩා පිළිබඳ මතකයන් වැඩිහිටි පරම්පරාවෙන් අසා දැන ගන්නවා විනා ඒවා කෙසේවත් වර්තමානයේ දක්නට ලැබෙන්නේ නැත. තවත් සමහරක් අවුරුදු ක්‍රීඩා ඒවායේ මුල් ස්වභාවයෙන්ම නොවෙනස් ව පවතිනු දක්නට ලැබේ. ඇතැම් අවුරුදු ක්‍රීඩා මුල් ස්වරූපයෙන් පවත්වා ගැනීමට වෑයම් දරන අවස්ථා ද දැකගත හැකි ය. මීට අමතරව දක්නට ලැබෙන නව ප්‍රවනතාවක් වන්නේ අලුත් අවුරුදු ක්‍රීඩා අලුතින් නිර්මාණය වීමත්, ඒවා සංස්කෘතිය සමඟ බද්ධ වීමත් ඉතා ඉක්මනින් සිදු වන බව ය. වෙනත් ක්‍රීඩා හා සැසඳීමේ දී අවුරුදු ක්‍රීඩාවල ඇති විශේෂත්වය වන්නේ එය ශ්‍රී ලාංකික සංස්කෘතිය හා බද්ධ වුණු සංස්කෘතික අංගයක් වීමයි. එය සංස්කෘතියේ කොටසක් වීමෙන් එය සමාජ, ආර්ථික, දේශපාලන සහ තාක්ෂණික පරිසරයේ බලපෑමට ලක්වීම සහ එම පරිසරය මඟින් එහි හැඩය තීරණය කරනු ලැබීම අපේක්ෂා කළ හැකි ය. මෙම පාරිසරික සම්බන්ධතාව සහ අවුරුදු ක්‍රීඩාවල පැවැත්ම පිළිබඳ ව දීර්ඝ ව අධ්‍යයනය කිරීම මෙමගින් සිදු කෙරිණි.

දේශපාලන, ආර්ථික, සමාජීය සහ තාක්ෂණික (PEST Environment) යන පාරිසරික තත්ත්වයන්ගේ හරය අතීතයට සාපේක්ෂව වෙනස් වී ඇති ස්වභාවය සහ එම සමාජයේ මූලික හර පද්ධතීන් අවුරුදු ක්‍රීඩාවේ ස්වභාවයට කරනු ලබන බලපෑම විශ්ලේෂණය කර ඇති අතර, එම තත්ත්වය තවදුරටත් ස්වභාවික වරණය (Natural Selection) නමැති නියමය සහ අභාවයාගේ අභාවය පිළිබඳ නියමය මත පිහිටා සාකච්ඡා කර ඇත.

**Key words** අවුරුදු ක්‍රීඩා, PEST Environment, ස්වභාවික වරණය, අභාවයාගේ අභාවය පිළිබඳ නියමය